# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2018

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයීමේදී අයදුම්කරුවන් බොහෝමයක්ම සාර්ථක පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී අයදුම්කරුවන් පහත අඩුපාඩුකම් සිදුකර තිබුණි. ඊට හේතු ලෙස උත්තර පත්‍ර පරීක්ෂකරුවන් පහත කරුණු නිරීක්ෂණය කර ඇත:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් අනිවාර්ය ප්‍රශ්න 20 කි. මුළු ලකුණු 40 කි.

මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා සාධනීය මට්ටමකට ලකුණු ලබාගෙන තිබුණු බව පෙනුණි. කෙසේ වෙතත් සමහර කොටස් සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු වල අඩුපාඩු නිරීක්ෂණය විය.

ඒ අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා පහත පරිදි වේ:

**1.1** සූක්ෂම ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂා කරන ලදී. ආර්ථික විද්‍යාවේ පදනම ලෙස සලකන හිඟකම හා එහිදී පැනනගින මූලික ආර්ථික ප්‍රශ්න අනුව "තේරීම" හා "ආවස්ථික පිරිවැය" ගැන අවබෝධය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය අසා ඇත. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**1.2** ඉල්ලුම යන සංකල්පය ආර්ථික විද්‍යාවේදී භාවිතා කරන නිසා වෙළෙඳපොල සමතුලිතය හා නම්‍යතාව යටතේ මෙම ප්‍රශ්නය අයදුම්කරුවන්ගේ අවබෝධය මැනිමට දී ඇත. මෙම ප්‍රශ්නයට වැඩි පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා ඇත.

**1.3** වෙළෙඳපොළ ව්‍යුහය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය දී ඇත. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුර "ඒකාධිකාරය" ලෙස නිවැරදිව හඳුනාගත් අයදුම්කරුවන් බොහෝමයක් සිටියහ.

**1.4** නිෂ්පාදනය හා පිරිවැය සංකල්පය යටතේ නිමැවුම හැසිරෙන ආකාරය ගැන පැහැදිලි අවබෝධයක් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු විය. බොහෝමයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි.

**1.5** මෙම ප්‍රශ්නයෙන් නිදහස් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක රජයේ මැදිහත්වීමෙන් සිදුවන ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රායෝගික අවබෝධය පරීක්‍ෂාවට ලක්කර ඇත. "උපරිම මිල" යන සංකල්පය අවබෝධ කර නොගැනීම නිසා බොහෝ පිළිතුරු වැරදි ඒවා විය .

**1.6** මුදල් සැපයුම පිළිබඳ වර්ගීකරණයන්ගේ නිර්වචනයන් පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක්කර ඇත. මේ ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන්ගේ පිළිතුරු නිවැරදි නොවූ බව පෙනේ. ඉහත සංකල්ප පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවන බව එමගින් ගම්‍ය වේ.

**1.7** කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව, ඉදිරිපත් කර ඇති දත්ත වලට අනුව උද්ධමන අනුපාතිකය සෙවීම සඳහා බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව ගණිතමය විසඳුම් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. පරික්ෂා කළ සියලුම පිළිතුරු පත්‍ර වල මෙම පිළිතුරු අසාර්ථක ලෙස ඉදිරිපත් කර ඇත. අයදුම්කරුවන්ට ඒ පිළිබඳ මනා අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි.

**1.8** මුදලේ අගය පිළිබඳ දැනුම පිරික්සීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. මුදලේ දේශිය මූර්ත අගය ලෙස නිවැරදි පිළිතුරු ලිවීමට බහුතරයක් අයදුම්කරුවන් අසමත් විය. මුදලේ අගය පිළිබඳ ඔවුන්ට නිවැරදි අවබෝධයක් නොමැතිකමින් ලකුණු ලබාගත නොහැකි විය.

**1.9** සාර්ව ආර්ථිකයක ප්‍රධාන අංශ අතර ජාතික ආදායමේ චක්‍රාකාර ප්‍රවාහයට කරන විදීම් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රශ්නය සඳහා ද අසාර්ථක පිළිතුරු සපයා සිටි සිසුන් බහුතරයකි.

**1.10** ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නයකි. මහ බැංකු වාර්තාව වැනි විෂය අනුබද්ධ වාර්තා පරිශීලනය කර නොතිබු බැවින් අයදුම්කරුවන් බොහෝදෙනෙක් අසාර්ථක පිළිතුරු සපයා තිබුණි.

**1.11 - 1.15** දක්වා දෙන ලද ප්‍රකාශයන්ගේ සත්‍ය අසත්‍ය භාවය පිළිබඳ නිවැරදි පිළිතුර තෝරා ගැනීමට නියමිතව තිබුණි. සමස්තයක් ලෙස ගත්කල මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයා තිබීම සාර්ථකව තිබූ බව දක්නට ලැබුන ද 1.12 ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු වැරදිය. උපයෝගීතා සංකල්පය පිළිබඳ විභාග අයදුම්කරුවන්ගේ දැනුම අල්ප බව එමගින් ගම්‍ය වේ. එසේම 1.14 ප්‍රශ්නයෙන් මුදලට ඇති ඉල්ලුම සංකල්පය පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නොතිබූ බව පෙනේ.

**1.16-1.20** දක්වා ප්‍රශ්න වලට පිළිතුරු දෙක බැගින් දී තිබූ අතර ඒ අතුරින් නිවැරදි පිළිතුර තෝරාගත යුතුයි. වැඩි පිරිසක් වැරදි පිළිතුර සපයා තිබුණේ **1.19** වන ප්‍රශ්නයටය. **1.19** ප්‍රශ්නයේ පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ අතිරික්ත පොලී අනුපාතය යන්නයි. තවද බොහෝ අයදුම්කරුවන් **1.20** සඳහා ආර්ථික වර්ධනය, වැරදි ලෙස පිළිතුර වශයෙන් තෝරාගෙන ඇත. එබැවින් ඉහත කරුණු සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම දියුණු කරගත යුතුය.

## B කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

### ප්‍රශ්න අංක **02** - ලකුණු 10

(a) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන සරල ප්‍රශ්නයකි. එහි උපකල්පන 3 ක් නම් කිරීම අපේක්ෂා කල අතර බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එසේ වුවද මෙම සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව ඉල්ලුම් වක්‍රය නිර්වචනය කෙරෙන උපකල්පන යනාදී විවිධ වැරදි පිළිතුරු දක්නට ලැබුණි.

(b) ධනවාදී හා සමාජවාදී (වෙළෙඳපොළ, සැලසුම්ගත) ආර්ථික ක්‍රම පිළිබඳ සංසන්දනාත්මක වෙනස්කම් තුනක් පමණක් පිළිතුර මගින් අපේක්ෂා කරන ලද අතර ආර්ථික ක්‍රම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම ප්‍රශ්නයේ අරමුණ වේ. කෙසේ වෙතත් බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුන ද අසාර්ථක හා අසම්පූර්ණ පිළිතුරු ද ඇතැම් අයදුම්කරුවන් විසින් දක්වා තිබුණි. එනම්,

- එක් අර්ථ ක්‍රමයක ලක්ෂණ පමණක් දක්වා තිබීම.
- අර්ථ ක්‍රම දෙක අතර ව්‍යුහයන් සැසඳීමකින් තොරව කරුණු දක්වා තිබීම.
- වෙළෙඳපොළ ව්‍යුහයන්ගේ ලක්ෂණ දක්වා තිබීම ආදිය එවැනි දුබලතා වේ.

න්‍යායාත්මක සංකල්ප පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව එමගින් පැහැදිලි වේ.

(c) දෙන ලද ඉල්ලුම් හා සැපයුම් සමීකරණ භාවිතයෙන් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කිරීම බොහෝ අයදුම්කරුවන් නිවැරදිව කර තිබුණි. සමහර පිළිතුරු වල දක්නට ලැබුණු දුර්වලතා අතර ගණිතමය දෝෂ එනම්, එකතු කිරීම, ගුණ කිරීම ආදිය නිවැරදිව සිදු නොකර තිබීම දක්නට ලැබුණි.

### ප්‍රශ්න අංක **03** - ලකුණු 10

(a) නිෂ්පාදන සංකල්පය පිළිබඳ දැනුම අවබෝධය පරීක්ෂාවට ලක්කරන ලද මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් සපයන ලද පිළිතුරු වැරදි ඒවා වූ අතර පිළිතුරු සැපයීමකින් තොර පිළිතුරු පත් ද බොහෝ දක්නට ලැබුණි. මුළු නිෂ්පාදනය යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදන ඒකක ප්‍රමාණය වැඩිවීම ලෙස ලියා තිබුණි. එමෙන්ම සාමාන්‍ය නිෂ්පාදනය යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදන ඒකක ප්‍රමාණය එක මට්ටමක පැවතිම යනුවෙන් ලිවීමෙන් ලකුණු ලබා ගැනිමට අපෙහොසත් වි තිබුණි. සමහර අයදුම්කරුවන් මුළු නිෂ්පාදනය = සාමාන්‍ය නිෂ්පාදන + ආන්තික නිෂ්පාදන ලෙස වැරදි ආකාරයට නිගමනය කර ඇත. ඉතාම සුළුතර අයදුම්කරුවන් පිරිසක් පමණක් තරමක් හෝ නිවැරදි පිළිතුරු සපයා තිබීමෙන් මෙම සංකල්පය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හෝ අවබෝධයක් නොමැති බව මැනවින් ගම්‍ය විය.

(b) ඒකාධිකරය හා ඒකාධිකාරී තරගය අතර සැසඳීමකින් වෙනස්කම් දැක්වීම තුලින් අදාල සංකල්ප පිළිබඳ අවබෝධය ප්‍රශ්නය මගින් පරීක්‍ෂා කෙරේ. මේ සඳහා ද බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබූ බව නොපෙනේ. බොහෝ පිළිතුරුවල දක්නට ලැබුණු දුර්වලතාවයන් අතර

- ඒකාධිකාරය පිළිබඳ පමණක් කරුණු දක්වා තිබීම.
- එකම කරුණ කිහිප ආකාරයකින් දක්වා තිබීම.
- ආබාධ පිවිසුම - පිටවුම යන සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව කරුණු දක්වා තිබීම ආදිය දක්නට ලැබුණි.

අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණක් මෙම ප්‍රශ්නයට මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**

(a) වෙළඳපොළ ආර්ථික ක්‍රමය තුළට රජයේ මැදිහත්වීමේ ප්‍රතිවිපාක පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්‍ෂා කිරීම මෙම ප්‍රශ්නය මගින් අපේක්‍ෂා කෙරේ. ප්‍රස්තාර ඇසුරෙන් ඒකක සහනාධාරයක් ලබාදීමේ ප්‍රතිවිපාක පැහැදිලි කිරීමේදී බොහෝ දෙනෙකු ප්‍රස්තාරය නිවැරදිව භාවිතා කර තිබූ බව නොපෙනේ. ප්‍රධාන වශයෙන් දක්නට ලැබුනු අඩුපාඩු වූයේ,

- ප්‍රස්තාරයේ ඉල්ලුම් සැපයුම් වක්‍ර නිවැරදිව නම් නොකිරීම,
- සැපයුම් වක්‍රය දකුණට විතැන් කර පැහැදිලි නොකිරීම, ආදියයි.

නිවැරදිව ප්‍රස්තාරය ඇසුරෙන් අදාල සංකල්ප පැහැදිලි කිරීමට සමත්ව තිබුනේ සුළු පිරිසකි. එමෙන්ම සහනාධාරයේ වාසිය පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් අතර බෙදියන ආකාරය තිරණය වනුයේ අදාළ භාණ්ඩයේ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන්ට අනුව බව කීමටවත් අයදුම්කරුවන් බොහෝමයක්ම අපොහොසත් විමෙන් ලකුණු ලබාගැනිමට අපොහොසත් වු බව පෙනේ.

(b) (i) මෙම කොටසින් බලාපොරොත්තු වුයේ රජය වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට මැදිහත්වීමට හේතු පරීක්ෂා කර බැලීමයි. මෙම කොටසට ද ඉතා අසාර්ථක පිළිතුරු සපයා තිබුණි.

පිළිතුරු සැපයු බොහෝ අයදුම්කරුවන් මිල පාලනයන් ගැනත් බදු පැනවීම ගැනත් ලියා තිබුණි. වෙළෙඳපොල බිඳ වැටීම නිවැරදි කිරීමටත්, ආදායම සහ ධනය සාධාරණ ක්‍රමයකට බෙදා හැරීම සඳහා රජය මැදිහත්වන බවත් ලියා නොතිබිණි. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙක් අදාළ ලකුණු දෙකෙන් මෙම කොටසට ලබා ගත්තේ ලකුණු එකක් හෝ බිංදුවක් හෝ පමණකි.

(ii) සහනාධාර ප්‍රදානය කිරීම හැර වෙළඳපල ආර්ථික ක්‍රමයට රජය මගින් මැදිහත් වියහැකි වෙනත් ක්‍රම 2 ක් සඳහන් කිරීම බලාපොරොත්තු විය. මෙම කොටසට බොහෝමයක් අයදුම්කරුවන් මිල පාලනය හා බදු පැනවීම පිළිබඳ ලියා ලකුණු දෙකක් ලබා ගැනිමට සමත් වී තිබිණි. එහෙත් වක්‍ර බදු යන්න ලිවිමට අපොහොසත්ව තිබිණි. රාජ්‍ය ව්‍යවසාය, පොදු භාණ්ඩ සැපයීම, කෝටා නියම කිරීම පිළිබඳව ලිවිමට ඔවුන් අපොහොසත් වී ඇත. අයදුම්කරුවන්ට මේ ගැන මනා අවබෝධයක් නොමැති බව පිළිතුරු පත්‍ර පරීක්ෂාවේදී වඩාත් පැහැදිලි විය.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**

(a) මෙම ප්‍රශ්නය මගින් ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ න්‍යායාත්මක සංකල්ප පිළිබඳ අවබෝධය හා දැනුම පරීක්ෂාවට ලක්කෙරේ. දෙනලද දත්ත ඇසුරෙන් සාපේක්ෂ වාසි න්‍යායට අදාලව එක් එක් නිෂ්පාදිතයේ සාපේක්ෂ වාසිය, ගණනය කිරීම් තුලින් දැක්විය යුතුය. මෙහිදී එක් එක් නිෂ්පාදිතයේ අඩුම ආවස්ථික පිරිවැය ගණනය කල යුතු අතර බොහෝ දෙනෙක් එය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී තිබුණි. එසේම සමහර අයදුම්කරුවන් නිරපේක්ෂ වාසිය මත පිළිතුරු සපයා තිබුණි. මෙහිදී මෙම සාපේක්ෂ වාසි සංකල්පය පිළිබඳ න්‍යායාත්මක දැනුම ප්‍රමාණවත් නොවූ බව දක්නට ලැබුණි.

(b) ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිවිපාක හතරක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය.

මෙම ප්‍රශ්නය සඳහා නිවැරදිව පිළිතුර සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු කොටසකි. අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලෙස දක්වා තිබුණේ ඩොලරය සහ රුපියල අතර වෙනසයි.

උදාහරණ වශයෙන් රුපියලේ ප්‍රමාණය කුඩාවන අතර ඩොලරය ඝනකමින් යුත් විශාල කාසියක් බවත් රුපියලේ නාමික අගය අනාගතයේදි කිසිදු කටයුත්තක් සඳහා යොදා ගැනීමට නොහැකි වීම පිළිබඳවත් ඩොලරයේ රුපියල් වටිනාකම ගණනය කරන ආකාරය පිළිබඳවත් ලියා තිබුණි.

මේ අනුව රුපියලේ අවප්‍රමාණය ගැන බොහෝ අයදුම්කවරුන්ගේ අවබෝධය ඉතාමත් දුර්වල බව කිව යුතුය. බොහෝ අයදුම්කරුවන් වැරදි ලෙස එකම පිළිතුර නැවත නැවතත් ලියා තිබුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**

(A) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්ති වල ගුණාත්මක පාලනයන් පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් අසා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බොහෝ පිරිසක් සම්පූර්ණ පිළිතුර සපයා නොතිබු බව දක්නට ලැබුණි. වාණිජ බැංකු මගින් එහි ගනුදෙනුකරුවන් සඳහා දෙන ණය වර්ග, බැංකු පොලී අනුපාතය, ව්චල්‍ය සංචිත අනුපාතය වැනි මහ බැංකුවේ ප්‍රමාණාත්මක පාලනයන් පිළිබඳව අයදුම්කවරුන්ගෙන් බොහෝ පිරිසක් පිළිතුරු ලෙස සපයා තිබුණි.

මෙම ප්‍රශ්නය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය පාලන උපක්‍රම දෙක අතරින් ගුණාත්මක (වරණාත්මක) පාලන විධි පිළිබඳව පරික්ෂාවට ලක්කළ ප්‍රශ්නයක් ලෙස හැඳින්විය හැක. මින් අදහස් කරන්නේ මුදල් ගලායන දිශාව පාලනය කිරීමයි. මුදල් සැපයුම ප්‍රමාණාත්මකව අඩු හෝ වැඩි කිරීම ප්‍රමාණාත්මක පාලන ක්‍රම මගින් බලාපොරොත්තු වන බව යන්න පටලවා ගැනිම නිසා ඔවුන්ට නිවැරදි පිළිතුර ලිවීමට නොහැකි වී ඇත.

(ii) වාණිජ බැංකු වල එකිනෙක ගැටෙන අරුමණු දෙක වන ලාභදායිත්වය හා ද්‍රවශීලතාවය අතර සමබරතාවයක් පවත්වාගැනිමේ අභියෝගයට බැංකු මුහුණ දිය යුතුව ඇත. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් අසන දේ පිළිබඳව තේරුම්ගෙන නොතිබු බව පෙනුනි. සමහරක් අයදුම්කරුවන් වාණිජ බැංකුවල ජංගම වත්කම් යටතේ ඇති ද්‍රවශීලතා වත්කම් ගැන කෙටි හැඳින්වීමක් කර තිබුණි. මුදල් ප්‍රධාන ද්‍රවශීල වත්කම ලෙසද දක්වා තිබිණි. එහෙත් නිවැරදි පිළිතුර ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවබෝධයක් නොතිබුණි.

මෙම කොටසට ලකුණු 04 ම ලබාගත් අයදුම්කරවැන් සිටියේ ඉතා සුළු පිරිසකි.

(B) ජාතික ආදායම් ගිණුම්කරණයෙහි ප්‍රායෝගික භාවිතය හා අවබෝධය පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරික්ෂාවට ලක්කෙරුණි. මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනිමට හැකිවු අයදුම්කරුවන් සිටියේ ඉතාමත් අඩු සංඛ්‍යාවකි.

දළ දේශිය වියදම සෙවිමට සමහර අයදුම්කරවැන් පෞද්ගලික පරිභෝජන වියදමින් ප්‍රාග්ධන ක්ෂය අඩුකිරිමක්ද කර තිබුණි. එමෙන්ම පෞද්ගලික පරිභෝජන වියදමට රාජ්‍ය පරිභෝජන වියදම් එකතුකර එයට දළ දේශිය ප්‍රාග්ධනය එකතුකර නොතිබුණි.

(C) රජයේ සාර්ව ආර්ථික අරමුණු තුනක් සඳහන් කිරීම මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂා කෙරුණි. මෙම කොටසට ද සාර්ථකව පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරවැන්ගෙන් අතලොස්සක් පමණි.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -